**ජපන් තානාපති කාර්‍යාලය**

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන අංකය :94-11-2693831~3, ෆැක්ස අංකය: 94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp


# පුවත්පත් නිවේදනය

දෙසැම්බර් 05, 2013

## මන්නාරම උතුර ඊචලවක්කයි ප්‍රාථමික විදුහලේ අධ්‍යාපනික වටපිටාව නගා සිටු වීමට ජපන් රජයෙන් ඇමරිකානු ඩොලර් 104, 835 ක ආධාරයක්

ජපන් රජය විසින් බිම් මට්ටමේ මානව ආරක්ෂණය උදෙසා ආධාර ව්‍යාපෘතිය යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ එච්චවක්කෙයි ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපනික වටපිටාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් 104.835 (දළ වශයෙන් රුපියල් මිලියන 12.5 ) ක මුදලක් පරිත්‍යාග කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ මන්නාරම, දිස්ත්‍රික්කයේ බටහිර මන්තෙයි හි ඊචලවක්කයි ප්‍රාථමික විදුහලේ පාසල් ගොඩනැගිල්ලක්, පරිපාලන ගොඩනැගිල්ලක්, ක්‍රියාකාරකම් ගොඩනැගිල්ලක්, ළමා උද්‍යානයක්, මෙන්ම පාසලේ ජල හා වැසිකිලි පහසුකම් ඉහළ දැමීමට අරමුණු කොට තිබේ. මීට අමතරව ගුරුවරුන්ගේ කුසලතා ඉහළ දැමීමට මෙන්ම පාසල් ළමුන්ගේ දෙමව්පියන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුමද මෙමඟින් පුළුල් කරනු ඇත.

ජපන් රජයේ රාජ්‍ය සහන ප්‍රතිපත්තියේ එක් ක්ෂේත්‍රයක් වන නැගී එන ප්‍රදේශ සංවර්ධනය කිරීම යටතේ මෙම ආධාරය ලබා දුන් අතර මෙම ප්‍රදේශ වල සිටින ජනයාගේ ආර්ථික අභිවෘද්ධිය උදෙසා යටිතල පහසුකම්ද මූලික වශයෙන් ඉහළ දැමිය යුතු බව ජපන් රජයේ අදහසයි. මෙවැනි ආකාරයේ පුළුල් ප්‍රවේශයක් මඟින් දීර්ඝ කාලීන සාමයක් සහ සංහිඳියාවක් ලඟා කර ගත හැකි බව ජපන් රජය විශ්වාස කරයි.

ජ්ලෑන් ශ්‍රී ලංකා ආයතනයේ නේවාසික අධ්‍යක්ෂක නෙඩ් ඉප්සි මහතා පැවසූයේ එහි ප්‍රධාන දැක්ම වනුයේ තම ශක්‍යතාවයන් හඳුනා ගත් ළමුන්ගෙන් හෙබි ලොවක් තැනීම බවයිග එම අරමුණ අනුව

යමින් වසර 32 ක කාලයක සිට ශ්‍රී ලංකාවේ දිළිඳු මෙන්ම ආන්තීකරණයට ලක්වූ ළමුන් උදෙසා කටයුතු කරමින් ඔවුන්ගේ ජිවිතය දුගීභාවයේ සිට වඩාත් සුභදායී වතාවරණයකට රැගෙන යාමට කටයුතු කරයි. ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යාපන වැඩසටහනේ අරමුණ වනුයේ ළමා හිතදායි පාසල් රාමුවක් තුලින් 0-5 වසර සීමාවේ ළමුන් සඳහා ගුණාත්මක පූර්ව ළමා අධ්‍යාපනයක්ද 6-11 වයස් සීමාවේ ළමුන් සඳහා ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක්ද ලබා දීමයි. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මෙම ළමා හිතදායි පාසල් රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකරාශී වෙමින් ප්‍රධාන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවේශය, ගුණාත්මකභාවය හා පාලනය යන අංශයන් ඉහල නැංවීම ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය අරමුණු කර ගෙන ඇත. ජපන් රජය මඟින් මන්නාරම ඊචලවක්කයි ප්‍රාථමික විදුහලේ යුද්ධයෙන් පීඩාවට පත් ළමුන් සඳහා එම මෙහෙවර ඉදිරියට කිරීමට අවස්ථාවක් ලබා දී ඇත.

ජපන් තානාපති නොබුහිතෝ හෝබෝ මහතාත් ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනයේ නේවාසික අධ්‍යක්‍ෂක නෙඩ් ඉප්සි මහතා අතර 2013 දෙසැම්බර් 05 දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදී.

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්‍යාලය
දුරකථන 011-2693831 දිගු අංකය 225
ඊ මේල් : cultujpn@co.mofa.go.jp